# ඇබෑර්තු

## රජය සතු විශාලතම අලෙවිසැල් ජාලය සඳහා
# ජ්‍යෙෂ්ඨ කළමණාකරු
# අභ්‍යන්තර විගණන (HM-1-1)

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ මූල්‍ය කළමණාකරණය / ව්‍යාපාර කළමණාකරණය / ගිණුම්කරණය / වාණිජ්‍යය පිළිබඳ උපාධියක්,

   සමඟ

   අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් (මාස්ටර්) හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගනු ලැබූ වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය

   සහ

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, රජයේ ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක කළමණාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්ද තිබිය යුතුය.

2. තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගනු ලැබූ වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය (Full Membership).

   සහ

   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, රජයේ ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක කළමණාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ට අදාළ සුදුසුකම් සපුරා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමණාකාර මට්ටමේ තනතුරක (MM) Grade I, අවම වශයෙන් වසර පහක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් හා අනෙකුත් දීමනා :**

වැටුප් පරිමාණය HM 1-1 රු. [80,295 - 15 x 2,270 – 114,345] මූලික වැටුප රු.Rs. 80,295/= (වයට අමතරව රජය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.)
(ප්‍රවාහන දීමනාව රු.50,000 + රජයේ චක්‍රලේඛයන්ට අනුව තනතුරට අදාළ අනුමත ඉන්ධන දීමනාව සහ දුරකථන දීමනාව (මාසික) මෙම තනතුර සඳහා හිමිය)

**වයස :** අවුරුදු 35 ට නොඅඩු සහ 55 ට නොවැඩි විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)

**පත්වීමේ ස්වභාවය :** ස්ථිර තනතුරකි. සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට හිමිකම් ඇත.

**අයදුම්කරු සතුව,**

- දත්ත ඇගයුම් කිරීමේ, සමාලෝචනය කිරීමේ, අර්ථ නිරූපණය කිරීමේ හැකියාව සමඟ විශිෂ්ඨ විශ්ලේෂණාත්මක ගැටළු විසඳීමේ සහ සංවිධානමය කුසලතා තිබිය යුතුය.
- ප්‍රබල නායකත්ව ගුණාංග, අන්තර් පුද්ගල හැකියාව තිබිය යුතුය.
- මනා තොරතුරු තාක්ෂණ කුසලතා ප්‍රදර්ශනය කළ හැකි විය යුතුය.
- බහු විෂයික කණ්ඩායම් වලට නායකත්වය දීමේ සහාථ කල හැකියාව. මානව හා අනෙකුත් සම්පත් නිසි පරිදි සේවයේ නියුක්ත කරවීමේ සහ කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීමේ පළපුරුද්ද.

**සියළුම අයදුම්කරුවන්,**

- ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
- දිවයිනෙහි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි මනා ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් හෙබි අයෙකු විය යුතුය.
- විශිෂ්ඨ පෞරුෂයකින් හෙබි අයෙකු විය යුතුය.

ඔබට නියමි සුදුසුකම් හා පළපුරුද්ද ඇති නම්, ඔබගේ ජීව දත්ත ලේඛනය, සහතික වල ඡායා පිටපත් සමඟ මෙම දැන්වීම පලවී දින 14 ක් ඇතුලත ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට හෝ අපගේ **vacancies@lankasathosa.org** යන විද්‍යුත් තැපෑල වෙත යොමු කිරීමට කටයුතු කරන්න. (ඉල්ලුම් කරනු ලබන තනතුර ලිපි කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි / විද්‍යුත් තැපැල් පණිවුඩයෙහි / "Subject" තීරුවෙහි සඳහන් කල යුතුය).

(ආයතනය ලිපි ගනු දෙනු කරනු ලබන්නේ ලේඛන ගත තෝරාගත් අයදුම්කරුවන් සමඟ පමණි.)


වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

සභාපති,
ලංකා සතොස ලිමිටඩ්, CWE මහලේකම් ගොඩනැගිල්ල,
අංක. 27, චොක්ෂෝල් වීදිය, කොළඹ 02

ලංකා සතොස
ජාතියේ මිල නිරක